# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1,487/16 – 2007 මාර්තු 06 වැනි අඟහරුවාදා – 2007.03.06

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (I) වැනි ඡේදය - සාමාන්‍ය

### ආණ්ඩුවේ නිවේදන

එල්. ඩී. බී. 8/80.

**1979 අංක 23 දරන ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය පනත**

3 වන වගන්තිය යටතේ නියමය

කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍ය, මෛත්‍රීපාල සිරිසේන වන මම, 1979 අංක 23 දරන ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය පනතේ 3 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගරු ජනාධිපතිතුමාගේ අනුමැතිය ඇතිව, මෙහි උපලේඛනයේ දක්වා ඇති ප්‍රදේශ "විශේෂ ප්‍රදේශ" ලෙස එම පනතේ කාර්යයන් සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

මෛත්‍රීපාල සිරිසේන,
කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍ය.

2007 පෙබරවාරි මස 28 වැනි දින,
කොළඹ දී ය.

### උපලේඛනය

විශේෂ ප්‍රදේශයේ සීමාවන් මෙසේ දැක්වේ :–

මහවැලි ගඟෙහි අතු ගංඟාවක් වන අඹන්ගඟ හා කළුගඟ ආශ්‍රයෙන් ඉදිකරනු ලබන ජලාශ අයත්වන ප්‍රදේශයන් ද, ඊට අදාල වෙනත් ඉදිකිරීම් කටයුතු කිරීමට අවශ්‍ය යැයි හැඟී යන ප්‍රදේශයන් ද, එම අතුගංගාවන්හි ඉහළ ජලධාරා ප්‍රදේශයන් ද, මෙම විශේෂ ප්‍රදේශයට ඇතුළත් වේ.

මෙම ප්‍රදේශයන්හි මායිම් පහත දැක්වෙන අයුරින් වේ :–

*නැගෙනහිරට* : අඹන්ගඟ හරහා ඉදිකරන ලද ඇළහැර වේල්ලේ මධ්‍ය ලක්ෂයේ සිට ගම ඇළ වම් ඉවුර අතුගංගාවේ උල්පත පිහිටි ලක්ෂය දක්වා ගිනිකොණ දෙසට අඳින ලද සරළ රේඛාවක් ඔස්සේ ද; එම ලක්ෂයේ සිට ගම ඇළ වම සහ දකුණ අතු ගංගා එක්වන ලක්ෂය දක්වා ඊසාන දෙසට වම් අතු ගංගාව ඔස්සේද; එම ලක්ෂයේ සිට උතුරු මැද පළාත් මායිම් දැක්වෙන රේඛාව හා දිගන්කන්ද සිට කන්දපිටවෙල දක්වා ඇති අඩිපාර කිරිඹයේ මධ්‍ය රේඛාව හරහා යන ලක්ෂය දක්වා දකුණු දිශාවට බරව සරළ රේඛාවක් ඔස්සේ ද; එම ලක්ෂයේ සිට එකී අඩිපාර ඔස්සේ ගිනිකොණ සහ දකුණට බරව මා ඔයෙහි මධ්‍ය ලක්ෂය හමුවන ලක්ෂය දක්වාද; එම ලක්ෂයේ සිට වයඹ දෙසට බරව හත්තොට අමුණේ ඇලෙහි අවසානයේ මධ්‍ය ලක්ෂය හමුවන තෙක් මා ඔයේ මධ්‍ය රේඛාව ඔසයේ ද; එම ලක්ෂයේ සිට ර. වැ.දෙ. පාරේ 28 වන සැතපුම් කණුව හමුවන


1A-G 008195 - 570 (2007/03)

ලක්ෂය දක්වා හත්තොට අමුණ ඇල ඔස්සේ දකුණු දිශාවට ද; එම ලක්ෂයේ සිට ර.වැ.දෙ. පාරේ 31 වන සැතපුම් කණුව හමුවන තෙක් දකුණු දෙසට අංක 307 දරන පල්ලේගම ග්‍රාමසේවක කොට්ඨාසයේ පල්ලේගම ගමේ නැගෙනහිර මායිම ඔස්සේ ද; එම ලක්ෂයේ සිට එකී ගමේ ගිනිකොණ මායිම හමුවන තෙක් හල්මිනි ඔය හරහා ඇති අඩිපාර ඔස්සේ දකුණු දෙසට ද; එම ලක්ෂයේ සිට කිතිගම ත්‍රිකෝණමිතික ස්ථානය දක්වා ඊසාන දෙසට ඇඳි සරළ රේඛාවක් ඔස්සේ ද; එම ලක්ෂයේ සිට ඊසාන දෙසට මදුමන කණිෂ්ඨ විද්‍යාලයේ උතුරු මායිම හා එම විද්‍යාලයට පැමිණෙන අඩි පාරේ අවසාන ලක්ෂය හමුවන ලක්ෂය දක්වා ඇඳි සරළ රේඛාවක් ඔස්සේ ද; එම ලක්ෂයේ සිට එම අඩි පාර ඔස්සේ නාගොල්ල පල්ලේගම මාර්ගයේ (බී-312) 61 වන කි.මී. කණුව හමුවන ලක්ෂය දක්වා දකුණු දෙසට ද; එම ලක්ෂයේ සිට නැගෙනහිර දෙසට එකී ප්‍රධාන මාර්ගය ඔස්සේ ලග්ගල හා විල්ගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මායිම හමුවන ලක්ෂය දක්වා ද; එම ලක්ෂයේ සිට එකී ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මායිම ඔස්සේ මාතලේ, මහනුවර දිස්ත්‍රික්ක මායිම සහ ලග්ගල විල්ගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මායිම හමුවන ලක්ෂය දක්වා ද ;

*දකුණට :* නැගෙනහිර මායිමේ අවසන් වරට සඳහන් කරනු ලැබූ ලක්ෂයේ සිට එකී දිස්ත්‍රික් මායිම් ඔස්සේ බටහිර දෙසට එම දිස්ත්‍රික් මායිම රත්තොට -ලග්ගල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස මායිම් හමුවන ලක්ෂය දක්වා ද; එම ලක්ෂයේ සිට එකී ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මායිම් ඔස්සේ මාතලේ - පල්ලේගම ප්‍රසිද්ධ මාර්ගයේ (බී-274) 26 වන කි.මී. කණුව හමුවන ලක්ෂය දක්වා උතුරු දෙසටද; එම ලක්ෂයේ සිට එකී ප්‍රසිද්ධ මාර්ගය ඔස්සේ රත්තොට හරහා කයිකාවල දී ඔපලන්ගල මාර්ගය හමුවන ලක්ෂය දක්වා බටහිර දෙසට ද ;

*බටහිරට :* දකුණු මායිමේ අවසන් වරට සඳහන් කරනු ලැබූ ලක්ෂයේ සිට උතුරු දෙසට කයිකාවල සිට ඔපලන්ගල මාර්ගය ඔස්සේ ගම්මැදි ඔය සහ හිතුරුවත් ඔය පසු කරමින් කුඹලොලුව ග්‍රාම නිළධාරි වසමේ රත්තොට ඔය හරහා ඉදිකර ඇති එල්ලෙන පාළමේ මධ්‍ය ලක්ෂය දක්වා ද; එම ලක්ෂයේ සිට අඹවගම ත්‍රිකෝණමිතික ස්ථානය දක්වා උතුරු දෙසට අඳිනු ලැබූ සරළ රේඛාවක් ඔස්සේ ද; එම ලක්ෂයේ සිට නාඋල ඇළහැර ප්‍රධාන මාර්ගයේ 30 වැනි සැතපුම් කණුව හමුවන ලක්ෂය දක්වාද; උතුරු දෙසට අඳින ලද සරළ රේඛාවක් ඔස්සේ ද ;

*උතුරට :* බටහිර මායිමේ අවසන් වරට සඳහන් කරන ලක්ෂයේ සිට ගෙදරගල්පතාන ත්‍රිකෝණමිතික ස්ථානය දක්වා ඊසාන දෙසට අඳින ලද සරළ රේඛාවක් ඔස්සේ ද; එම ලක්ෂයේ සිට ඊසාන දෙසට පුස්වැල්ලගොල්ල ත්‍රිකෝණමිතික ස්ථානය දක්වා අඳින ලද සරළ රේඛාවක් ඔස්සේ ද; එම ලක්ෂයේ සිට උතුරු මැද පළාත් සහ මධ්‍යම පළාත් වෙන්වන පළාත් මායිම් ඔස්සේ දකුණු දිශාවට එම මායිම අඹන්ගගේ මධ්‍ය ලක්ෂය හමුවන ලක්ෂය දක්වා ද; එම ලක්ෂයේ සිට අඹන්ගගේ මධ්‍ය රේඛා ඔස්සේ ආරම්භක් නැගෙනහිර ලක්ෂය දක්වාද වෙයි.

03-614

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.